වසන්තයයි,ඔබයි,මමයි සමග සමන්

ලොව ඕනෑම නිර්මාණයක් බිහිවන්නේ නිර්මාණාකරුවකු වෙතිනි. එහෙත් ඇතැම් නිර්මාණ ලෝකයාට දායාද කිරීම සඳහා වාහකයෙකු අවශ්‍ය වෙයි. ඒ පිළිබඳ නිපුණතාවයක් ඇති ශිල්පියෙකු අවශ්‍ය වන්නේ නිර්මාණකරුවකුගේ නිර්මාණයක් ලොවට දායාද කිරීමටයි. ලොවට දරුවකු දායාද කිරීමට සිතනා වල්ලභයකු සිය ප්‍රියාවගේ සහය පතන්නාක් මෙනි.

ගීත නිර්මාණකරණය ද මේ ස්වභාවික රීතීන්ට අනුකූල වෙයි. ගී පද රචකයෙකු සිය නිර්මාණය ගායන ශිල්පියෙකුගේ හඬින් ගීයක් එළිදැක්වීමේ කල් බලනා නවක ගී පද රචකයෙකු සමගයි අපගේ මේ කතිකාවත. නමින් ඔහු සමන් කුලරත්න හමි වන්නේය. ගී පද රචනා දහසයකින් සමන්විත "වසන්තයයි, ඔබයි, මමයි" සංගත තැටිය එළි දැක්වීමට ලුහි ලුහියේ සූදානම් වන අතරේදී සමන් අප සමගින් පිළිසඳරකට එක් වන්නේ. ජනගත කීමට පෙර මේ වන විට සමන් සිය කුළුඳුල් ගී එකතුවේ මුහුණුවර විඳ ඇත්තේය.

"මට මතක් වෙනවා මගේ පළවෙනි ම සින්දුව අහන්න ලැබුණ අවස්ථාව. ඒ ටී.එම්.ජයරත්න මහත්මයා ගායනා කරපු සින්දුව....."සමන් අප හා එක් වෙයි....

"කුරහන් මල් පිපිලා පැල අද්දර

සාකච්ඡා කළේ
සිසිර දිසානායක

ගීත සතුටින් සනහා
සඳකෑන් මල් වැටිලා ඉහ ඉද්දර
නුඹ කැන්දන් එනවා...."

"මට මතකයි ඉන්දුපිත් මේ සින්දුව මට එවනවැ කියලා ලංකාවෙ ඉඳන් කිව්වෙ එක රෑක. කොහොම හරි මට ඒක ඊමේල් කරලා තිබුණේ පාන්දර පහයි හතළිස් පහට වගේ. ඒ වෙලාවෙම බිරිඳත් එක්ක කාර් එකට ගිහින් මේ සින්දුව ඇහුවා, හොඳින් අහන්න ඕන නිසා. ඇත්තටම මටම හිතාගන්න බැරිවුණා මම ලියපු ගීතයක් ද කියලා." මුළු රැය නිදි වරා පාන්දර සිය ගී නිර්මාණය ඇසූ මොහොත සිහිපත් කරන කල පවා සමන්ගේ නෙතු අග කඳුළක් උපදියි. කට හඬ බිඳෙයි. සිය කුළුඳුල් දරුවා දැකගත් මොහොතේ පියෙකු තුළ ඇතිවන සතුට ම නොවේ ද ඒ?

"හැම දෙයක්ම එකතු වුණ නිර්මාණයක් ගීයක් විදියට අහන්න ලැබෙන මොහොතේ ඒ තුළ මොනතරම් අපූර්වත්වයක් තියෙනවාද කියන එක අත් විඳින්න ලැබුණා. "ඔය හැම ගීතයක් ගැනම ඔය විදියයි දැනුනේ. අන්තිම ගීතය එවනවා කියලා ඉන්දුපිත් කියලා දවස් තුනකට පස්සෙයි ලැබුණෙ.ඇත්තටම ඒ දවස් තුනේ ම මම නිදි වැරැවා." ඒ ගීතය සංගීත් නිපුන් සනත් නන්දසිරි ගායන ශිල්පියාණන් ගැයූ ගීතයයි.

"සොදුරු ප්‍රේමයක චිතකය අඹියස
කඳුළු සළුව උඩු සුළඟට විසි කර
කඩා හැලෙන සිත් අහසට ඉඩ හැර
කෙසේ දවන්න ද මතක පිරුණ හිත"

සමන් කුලරත්නගේ සියළුම ගී පද රචනාවන් සඳහා නනු හා සංගීත නිර්මාණ කළේ ඉන්දුපිත් මිරිහාන නම් වන තරුණ සංගීත නිර්මාණ ශිල්පියායි. මෙල්බන් නුවර වෙසෙන ඉන්දුපිත් ශබ්ද පරිපාලනයෙන් ද හපන්කම් පෙන්වන අතර ඔහුගේ ම ශබ්දාගාරයක් මව්බිමේ නොබෝදා විවෘත කළේය.

"ඉතින් ඔය නිදි වරපු කතාව මම ඉන්දුපිත් ට කිව්වම එයත් මට කිව්වා ඒ ගීත අහලා මගෙන් ප්‍රතිචාර ලැබෙනකල් එයා බලා හිටියෙත් ඔය වගේ තමා කියලා". නිර්මාණකරුවන් දෙදෙනෙකුගේ සිය නිර්මාණ ගනුදෙනුවක ඇති චමත්කාරයයි ඒ. සීගිරි රජ දවස ලාලන රූප සිතුවම් කළ සිත්තම් නිර්මාණකරුවකු තුළ ඇති වූ ආදරණීය හැඟුම් පද පෙළකට කැටි කරන්නට සමන් කුලරත්න නම් වන ගී පද නිර්මාණකරුවා ගත් සාර්ථක උත්සාහයයි මේ...

"සීගිරියේ බිතු සිතුවම් අතරේ
තෙළි තුඩගින් ජීවය ලද මිගිරේ
සදාකාලික අපේ ආදරේ
ලොවන් නො සඟවා පවසනු සොඳුරේ....."

තමන් සිත්තමට නංවනා ලාලනිය සමග රහසින් පෙමින් බැඳෙන සිත්තරාගේ හැගීම් ගායනයෙන් රසිකයා වෙත ගෙන එන්නේ ආචාර්ය වික්ටර් රත්නායකයන්ගේ හඬිනි.

"ඇත්තටම මේ දේවල් ඉන්දුපිත් කළේ තමන්ගේ ම දේවල් බවට පත් කරගෙන." සමන් ඉන්දුපිත් මිරිහාන යොවන සංගීත නිර්මාණකරුවාණන් පිළිබඳව සිහිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. "ඇත්තටම මම ඔහු ගැන තියපු විශ්වාසය ඔහු ඒ විදියට ම රැක්කා. ඒ වගේම මට කරන්න බැරි කොටස ඔහු හොඳින් ඉෂ්ට කළා. ගැලපෙනම දේ ඉහළින් ම කළා."

"මට ඇත්තටම සංගීත ශිල්පියෙක් හරි ගායන ශිල්පියෙක් විදියට හරි ඉස්මතු වෙන්න වුණේ නෑ. මගේ ප්‍රාථමික අධ්‍යාපනයේදී සංගීතය ඉගැන්නුවෙ සිරිල් පෙරේරා මහත්මයා. ඒ කියන්නේ ආනන්ද පෙරේරා සංගීත ශිල්පියාගේ පියා. ඒ වගේ ම ද්විතියික අධ්‍යාපනයේ දී සංගීතය ඉගැන්නුවෙ සුනිල් සිරිවර්ධන මහත්මයා. ඒ මහත්මයා මගේ පියාගෙන් ගිරාගම සොන්දර්ය ගුරු විද්‍යාලයෙන් ඉගෙනගෙනත් තියෙනවා. ඒ වුණාට ඒ පැත්තට උනන්දුවක් ඇති වුණේ නෑ. ඒත් පොඩි කාලෙ ඉඳන් ම කවි නම් ලිව්වා. ඇත්තටම ඒ හැකියාව ගැන දන්න මගේ බිරිඳත් මේ ගීත එකතුව කරන්න ලොකු සහයෝගයක් දුන්නා." කුමුදුනී ලද්දුවහෙට්ටි මහත්මිය සමන්ගේ ප්‍රිය බිරිඳයි.

සමන් මුළිකව මාවනැල්ල රන්දිවෙල කණිෂ්ඨ විද්‍යාලයේ සිප් සතර හදාරා දෙවනුව මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් ද්විතියික අධ්‍යාපනය ලැබීය. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයේ උගත් උපාධිධරයෙකි. පියා චිත්‍ර කලාව පිළිබඳව කථිකාචාර්යවරයෙකු වන අතර, මව විදුහල්පතිනියකි.

"ඇත්තට ම මගේ අම්මත් තාත්තත් දෙන්නම ඒ කාලෙ ඉඳන් ම පත්තර වලට කවි ලිව්වා. ඒ වගේ ම ගෙදර කලායතනයක් තිබුණා. නමුත් එයාලා කැමති වුණේ නෑ අපි එතෙන්ට යනවට. මොකද ඒ කාලේ කලාවට වැඩි ඉල්ලුමක් තිබුණෙ නෑ.

"පවුරක් සේ මහාධීර"

සසුරක් වත් තේජමාන
අප දුටු ඒ මහාවීර
පියාණනි -ඔබයි රාජ

ගායනය සුනිල් එදිරිසිංහ

"ඉතින් ඔය පසුබිමත් එක්ක තුනේ පන්තියේ චිතර ඉඳන් මම කවි ලිව්වා. පාසැලේ බිත්ති පුවත් පත් අපි ම හදාගෙන ලිව්වා. සරසවියෙදීත් ඒ කලා කටයුතු වලට දායක වුණා.

"සඳ උතුරන රාත්‍රියක හෙමින් හෙමින් ඇවිද යන්න
සිතුවම් කළ පාට පාට
මල් කළඹක් අත
තියන්න."

කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාගේ හඬින් ගැයෙන ඉහත පද පෙළ සොඳුරු ආදරයේ බොළඳබවින් තුරුණු හදවත් ප්‍රේමාතුර කරවයි. ඒ ඔහුගේ සරසවි අත්දැකීම් අනුව ලියැවුණ දේද?

"ආදරය විතරක් ම නෙවෙයි. විවිධ තේමා වලින් ගීත ලියවුණා. මගේ අත්දැකීම් වගේම යාළුවන්ගේ අත්දැකීම් ඒවාට හේතු වුණා. ඇත්තටම ගීත ලියන්න යොමු වුණේ මෙල්බන් වලට ආවට පස්සෙයි. ගීතයක් ලියලා දෙන්න කියලා මගෙන් මුලින් ම ඉල්ලා හිටියේ ධනුෂ්ක ප්‍රභාත් කියන මගේ සහඳයා. ලංකාවේ සරසවි අධ්‍යාපනයෙන් පස්සේ මගේ නිදහස ටිකක් සීමා වුණා. රැකියාවේ වැඩ කටයුතු නිසා." සමන් සම්පත් බැංකුවේ සහ ෆෑන් ඒෂියා බැංකුවේ කළමණාකරුවකු ලෙස කලක් සේවය කළේය.

"ඇත්තටම ධනුෂ්ක වුණාත් මගෙන් සින්දුවක් ලියලා දෙන්න කියලා ඉල්ලුවෙ මම කවි ලියන බවක්වත් නොදැන. ඒත් දැන් වෙනකොට ලංකාවේ ප්‍රවීණයින්

34 වන පිටෙන්

සියල්ල මෙහෙයවන්නේ ජාත්‍යන්තර බූවල්ලෙක්. ඔය පොඩි පොඩි පොකැට් සිනමා උළෙලවල් තියලා සම්මාන දෙන බොහෝ චිත්‍රපට ලිංගික මතවාද හා අපේ රටේ සංස්කෘතික ලක්ෂණ විකෘති කළ නිර්මාණ. ඒ වගේම මවුන් ඒවා නිර්මාණය කරන්න ප්‍රාග්ධනය පවා සපයනවා. එහෙත් ඔය එක සිනමා පටියක්වත් ඔස්කා සම්මානයක් අරන් තියෙනවද ? ඒවගේම ටක්කන් උළෙල, ප්‍රංශයේ කෑන්ස් වගේ උළෙලවල සම්මානයට පාත්‍රවෙලා තියෙනවද ? නැහැ. අතිමධ්‍යම හරි පරිස්සම් වෙනව ඒ වගේ සම්මානයක් ලබාදෙන්න. මං ඒකට තව උදාහරණයක් දෙන්නම්. ටයිටස් නොටවත්ත කියන්නෙ අපිට හිටිය දක්ෂ ප්‍රවීන නිර්මාණකරුවෙක්. ඒත් මහුගේ හදයා සිනමාපටියට ජාත්‍යන්තර සම්මානයක් ලැබුනේ ඇයි. ඒ චිත්‍රපටියෙන් අන්තිමට දෙන පණිවිඩය තමයි අපිව සිවිලියිස් කළේ සුද්දා කියන එක. චිත්‍රපටිය අවසාන වෙන්නේ නාවර හොටු පෙරාගත්තු, දුවිල්ල නාගත්තු අපේ පොඩි එවුන් සුද්දයි, සුද්දගෙ දුවගෙයි කුඩය යටට ගිහිල්ල ආවරණය වෙන එකෙන්. අපි උන්ට පක්ෂව යමක් නිර්මාණයෙන් පෙන්නනකොට, මානව හිමිකම් හොඳින්ම අපිට කියල දුන්නෙ උන් කියල පෙන්නකොට, ඒ සතුටට උන් අපිට සම්මාන දෙනවා.අන්තිමේදි ටයි මහත්තය පවා නිහඬව මෙය අත්ත බව පිළිගත්තා.

අද අපේ රටේ රූපය නිසාම නළු නිළියො වෙලා ජනප්‍රිය වුණු සෑහෙන පිරිසක් ඉන්නවා. ඒ වගේම ඒ අය රටේ ජනතාව අතර ඉහළින් වැජඹෙන තත්වයක් පෙන්නුම් කරනවා. හැකියාව යටපත් වෙලා රූපයේ ලස්සන දකින බලන කලාව ගැන ඔබගේ හැඟීම කුමක්ද ?

ඇත්තටම සහතික බලන්නැති ඕනෑම කෙනෙකුට ඕනෑම විදියට ඇතුළත් වෙන්න පුළුවන් කර්මාන්තයක් තමයි කලාව. අනෙක දේශපාලනය, වෛද්‍යවරයෙක්, කාර්මිකයෙක්, ඉංජිනේරුවෙක් වෙන්න දැනුම සහතික අවශ්‍ය වුනාට කලාවට ඒක ඕන නැහැ. එවැනි ශිල්පීය දැනුමක් අධ්‍යාපනයක් නැති බොහෝ පිරිසක් කලාවට බැහැල අපේ රටේ කලාව විනාශ කරල තියෙනවා. එහෙත් බලන්න ඔබට එන්ගලන්තයට ගිහිල්ල අඩු තරමින් ඇංග රංචනය කරන්න පුළුවන්ද කියල. සිනමා කැමරාවක් මෙහෙයවන්න පුළුවන්ද කියල. බැහැ. ඔවුන් මුලින්ම හොයන්නෙ ඔබගේ පළපුරුද්ද. ලයිෂන් එක. එහෙත් අපේ රටේ ඇඟ විකුණල කලාවට ඇවිල්ල අපි පොරවල් කියන පිරිසක් බිහිවෙලා තියෙනවා. රූපය, පොත්තේ සුඳ නිසා කලාවට ඇවිත්, හැකියාව දක්ෂතාවය නැත්නම් ඔවුන් මාස දෙක තුනකින් ඇහැටවත් දකින්න නැති වෙලා ජනතාවගෙන් ඈත් වෙලා යනවා. ඒවගේ ආවෝ ගියෝ කලාකාරයො කොච්චර දෙනෙක් මේ අවුරුදු දහය දොළහට ඇවිල්ල නැතිවෙලා තියෙනවද. අනෙක ඒ කලාකාරයන්ගේ තමක්වත් මතක තියෙනවද. අර අරකෙ ඉන්න අරයා මේකෙ ඉන්න මෙයා වගේ කලා කාරයන් කී දෙනෙක් ටෙලිනාට්‍යවලින් මතුවෙලා නැතිවෙලා ගිහින් තියෙනවද. හැකියාව දක්ෂතාව ඇති කලා ශිල්පීයා ජීවත්වෙන්නේ ජනතාවගේ හදවතේ

අද ලෝකයේ තවමත් හොඳම නිර්මාණ බවට පත්වෙලා තියෙන්නේ පැරණි චිත්‍රපට. ඉන්දියාව ගත්තොත් එහේ නිර්මාණය වුණු හොඳම චිත්‍රපටි තමයි සත්‍යජිත්රායිගේ නිර්මාණ. ලංකාවේ නම් ලෙස්ටර්ගෙ, පතිරාජගෙ වගේ කළු සුදු පටි වලින් හදපු එදා ගම්පෙරළිය ,හිඩානය, ඔබරු ඇවිත් වගේ නිර්මාණ. අද තාක්ෂණය මෙතරම් දියුණු වෙලත් ඇයි එවැනි සංකේත රූපකභාවිතය අතින් ඉහළ පරිපූර්ණ නිර්මාණ බිහි නොවන්නේ ?

මම කලින් ප්‍රකාශ කළා වගේ අද ලාභය බලාපොරොත්තු වෙන ජාත්‍යන්තර බූවෙල්ලක් හරහා ක්‍රියාත්මක වෙන අලුතුම වෙළඳ පොළක් තමයි මෙම නිර්මාණවල නිර්නායකයන් තීරණය කරන්නෙ. ඒ වගේම තාක්ෂණය දියුණු වෙනව කියන්නේ මිනි සාගේ සිතුවිලි ප්‍රමාණය අඩුවෙනවා කියන එකයි. විනාඩි තුනක් වයින් කරලා දුවන පුංචි කැමරාවකින් තමයි චාලි චැප්ලින්ගේ චිත්‍රපටි කළේ. ඒවා සංස්කරණය කරන්න කොතරම් අමාරු වෙන්න ඇතිද ? එහෙත් චැප්ලින්ගේ නිර්මාණවලට ළංවිය හැකි නිර්මාණ තවමත් ලෝකේ බිහිවෙලා නැහැ. සත්‍යජිත් රායිගෙ මහ නගර්, පාදර පාංචලි, අපූර් සංසාර්, අපරාජිතෝ ඉහළින් වැජඹෙන නිර්මාණ. ඒවා කළු සුදු චිත්‍රපටි වුණාට තවමත් ලෝකේ ජනතාව ඒවා රස විඳිනවා. අද වෙන්නෙ නිර්මාණශීලි සිතුවිලි රටාව වෙනස් කරගෙන තාක්ෂණය පෙළහර පාන එකයි. මොන ඩිජිටල් ක්‍රම ආවත් වැඩක් නැහැ ඒවා නිර්මාණශීලි නැත්නම්.

ආනන්ද පද්මසිරි යන ලක්ඛිමේ විශේෂාංග ලේඛකයා කියල තිබ්බ ඔබ කලා වෘත්තියේ නියැළෙමින් අනෙක් කලාකරුවන් විවේචනය කරමින් එම වෘත්තියට හානියක් කරනවා කියලා. ලංකාවේ මාධ්‍ය තුළින් ඔබෙන් එයට පිළිතුරක් ඔබගෙන් ලැබුණේ නැහැ. දැන් එයට පිළිතුරක් දිය හැකිද ?

මගේ වෘත්තීය ගුරු වෘත්තියනේ. ගුරු වෘත්තියේ ඉඳගෙන තමයි මං කලාව කරන්නේ. අනෙක මගේ අදහස්වලට රටේ සාමාන්‍ය ජනතාව වගේම විද්වතුන් පවා එකඟවෙලා තියෙනවා. ඔවුන් ඒවා සත්‍ය බව පිළිඅරන් තියෙනවා. අරක්කු ටිකටයි, කුකුල්මස් කෑල්ලටයි තැන් තැන්වල කියවන අයගේ ප්‍රශ්න වලට පිළිතුරු දීම අවැඩක් නිසා මං නිහඬව හිටියා.

තමන් රඟපෑ චරිතයක් නමින් කලාකරුවෙක් දැකීම, ඒ නමින් ඔහුව ඇමතීම දින ක්‍රියාවක් ලෙසයි ඔබ දකි න්නෙ. එහෙත් බොහෝ ශිල්පින් මාධ්‍යය තුළින් ප්‍රකාශ කරන්නෙ මං කරපු චරිතෙ ප්‍රේක්ෂකයා වැළඳගත්ත නිසයි මං ජනප්‍රිය වුණේ කියල. එයට ලැබෙන පිළිතුර?

එක මහ පට්ටි පල් බොරුවක්. චරිතය නොවෙයි රංගන ශිල්පියයි ප්‍රේක්ෂකයා වැළඳගත යුත්තෙ. අපිට උපතින්ම නමක් ලැබිල තියෙන්නෙ. ඒ නමින් ආමන්ත්‍රණය කරනවට තමයි කවුරුත් කැමති. අපි චරිත දාහක් රඟපෑවත්, අපේ ප්‍රතිභාව තුළින් ජනතාවට යමක් දෙන්න බැරිනම් වැඩක් තියෙනවද ඔය අපේ රටේ සීතිබෝල නළු නිළියො කියන අයගෙ බහුබූත කතා. ඕව තියෙන්නෙත් අපේ රටේ විතරයි. බොහෝ රටවල ප්‍රේක්ෂකයො තමුන්ගෙ රංගන ශිල්පියා දකින්නෙ අමතන්නෙ බොහෝ ගරුත්වයකින් හා ඔවුන්ගෙ නමින්.අපේ අය සිල්ලර වෙලා, විකිණිලා ඒ ගරුත්වය නැතිකරගෙන.

දුක දිනා ජයගත් කලාකරුවෙක්, නිර්මාණ ශිල්පියෙක්, ගුරුවරයෙක් වශයෙන් මෙරට වෙසන ලාංකික ප්‍රජාවට ඔබ ලබාදෙන පණිවිඩය කුමක්ද?

ගැටුමක් නැතිව ඵලයක් නැත. සියලු දේ ලැබෙන්නේ තමුන්ගේ උත්සාහය මතයි. තමන්ගේ උත්සාහයෙන්, ධෛර්යයෙන්, කපපවීමෙන් ගැටුම්වලට මුහුණදී ඉරණම ඉරාගෙන ඉදිරියට යා හැකි චිත්ත ශක්තියක් මිනිසෙකුට උප්පත්තියෙන්ම ලැබිලා තියෙනවා. ඔය කැත ලස්සන නොවෙයි ඒ ලැබුණු චිත්ත ශක්තිය තුළින් නොසැලී ඉදිරියට ගමන් කරන්න ගැටුම්වලට මුහුණ දී අසරණ නොවී ඒ ශක්තිය තව තවත් වඩාත්ගෙන නොසැළිම ඉදිරියට යන්න. ඔබ සැමගේම අනාගතය යහපත් වෙන්නේ එවිටයි.

ලක්ෂ්මන් කොඩිතුවක්කු
සමග කළ සංවාදයකි

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com